# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2353/32 – 2023 ඔක්තෝබර් මස 10 වැනි අඟහරුවාදා – 2023.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක MN/60, ඔලයිතොඩුවායි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඔලයිතොඩුවායි ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MN/MNN/2022/326 හා 2023.03.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර '**A**' – ඔලයිතොඩුවායිකානි – ප්‍රමාණය: හෙක්. 0.8403

උතුරට සහ නැගෙනහිරට: (සේලන් බිස්නස් (පුද්ගලික) සමාගම විසින් හිමිකම් කියන) ඔලයිතොඩුවායිකානි; දකුණට: (සේලන් බිස්නස් (පුද්ගලික) සමාගම විසින් හිමිකම් කියන) ඔලයිතොඩුවායිකානි සහ මු. පි. මන් 812 හි කැබලි අංක 1; බටහිරට: මු. පි. මන් 812 හි කැබලි අංක 1 සහ (සේලන් බිස්නස් (පුද්ගලික) සමාගම විසින් හිමිකම් කියන) ඔලයිතොඩුවායිකානි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/11/2022/CEB/153.
2023 අගෝස්තු මස 31 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 10 - 0125